# සුවසෙත සලසන කීලේසන ප්‍රතිකාර

**වෛද්‍ය ඩී.පී. අතුකෝරාල**

**ඊයම්, රසදිය, යකඩ, පාසානම්, චූර්ණාකර වැනි ඛනිජ වර්ගයක් වෙනත් ද්‍රව්‍යයක් සමග වන්ධනයවීමේ ක්‍රියාවලිය කීලේසනය යනුවෙන් හඳුන්වනු ලැබේ. මෙම ලිපියේ සඳහන් ප්‍රතිකාර ක්‍රමය සඳහා වෙනත් ද්‍රව්‍යයක් ලෙස යොදු ගනු ලබන්නේ ඇමයිනෝ අම්ලයක් වන එතිලීන් ඩයමීන් ටෙට්‍රාසෙටික් අම්ලයයි.(EDTA) මෙය ප්‍රතිකාරයක් වශයෙන් ගත් විට හෘද නාල ඝණ තත්ත්වයට පත්වීම හා වයස්ගතවීම නිසා ඇතිවන රෝගී තත්ත්වයන් පමා කිරීම හා ප්‍රතිවර්තනය සිදුවන බව ද පෙනීගොස් තිබේ. රෝග කාරක සොයාගෙන නොමැති බොහෝ රෝගාබාධවල රෝග ලක්ෂණ පහව යන බවද පෙනීගොස් ඇත. හදවත, මොළය, දෙපා ආදියේ රුධිර ගමනාගමනයට අවහිරයක් වී ඇත්නම් එය ද මගහැරී යයි. තුවාල කුණුවීම වැළකේ. මෙම ප්‍රතිකාරය ගන්නේ නම් බයිපාස් සැත්කම් හෝ රුධිර නාළ පුළුල් කිරීමේ සැත්කම් හෝ අවශ්‍ය නොවන්නට පිළිවන. එය පිළිකා වළක්වාලීම සඳහා ද ඉතාමත් සුදුසු බව පරීක්ෂණවලදී හෙළිවී තිබේ.**

මුක්ත බණ්ඩ Free radicals නිසා රෝගීවීම වළක්වාලීමට ඇති හැකියාව මෙම ප්‍රතිකාර ක්‍රමයේ සාර්ථකත්වය මොනවට පැහැදිලි කරන්නකි. මෙය ආරක්ෂා සහිත මෙන්ම වියදම් අඩු වූද ප්‍රතිකාර ක්‍රමයකි. සෞඛ්‍යසම්පන්න ජීවන රටාව, ක්‍රමවත් ආහාර, දුම්බීමෙන් වැළකී සිටීම අතිරේක පෝෂණ කොටස් ගැනීම ආදිය කෙරෙහි ද උනන්දුවක් දක්වමින් මෙම ප්‍රතිකාරය ගත් විට හෘදයාබාධ, මොළයේ රුධිර නාළ සම්බන්ධිත රෝග, රුධිර නාළ ඝනවීම, ජරපත්වීම වැනි තත්ත්වයන් මගහැරී යයි. එවිට හෘදයාබාධ, බයිපාස් සැත්කම්, අංග ඡේදනය, ආඝාතය ආදිය පිළිබඳ සැක පහළවීමක් ද සිදු නොවේ.

ප්‍රථමයෙන්ම මෙම ප්‍රතිකාර ක්‍රමය යොදගනු ලැබුයේ දෙවන ලෝක මහාසංග්‍රාම සමයේ විෂ වායුව නිසා ඇතිවන හානි මගහරවාලීම සඳහා ය. 1948 පමණ දී අමෙරිකාවේ බැටරි කර්මාන්තශාලාවල හා නැව් පින්තාරුකළ සේවකයන් ඊයම් විෂ වීමට ගොදුරු වන්නට වූ විට වෛද්‍ය ප්‍රතිකාරයක් වශයෙන් මෙය යොද ගන්නා ලදී. එද සිට මෙම රෝගී තත්ත්වය සඳහා වැඩිහිටි අයට පමණක් නොව කුඩා දරුවනට පවා මතභේදයකින් තොරව භාවිත කිරීමට පෙළඹුන බව පෙනේ. 1955 දී පපුවේ කැක්කුම ඇති රෝගීන්ගේ රුධිර නාළ තුළ බැඳී ඇති කාරම් දියකර හැරීම සඳහා මෙම ප්‍රතිකාර ක්‍රමය උපයෝගී කරගත්හ. එකල සිටම මෙම ප්‍රතිකාර ක්‍රමයේ සාර්ථකත්වය පිළිබඳ වාර්තා වෛද්‍ය සඟරාවල පළවන්නට විය. බයිපාස් සැත්කම් හා රුධිර නාළ ශල්‍ය වෛද්‍යවරුන් පෞද්ගලික හේතූන් මත ඇතැම්විට මීට විරුද්ධව මත ප්‍රකාශ කොට ඇති බව තම් දකින හැකි ය. කීලේසන ප්‍රතිකාරය ශල්‍ය වෛද්‍යවරයාට ළඟාවිය නොහැකි, මොළය තුළ සැඟවුන ස්ථානවල ඇති ඉතා සියුම් කේශනාලිකා තුළ පවා රුධිර සංසරණය කෙරෙහි යහපත් ලෙස බලපවත්වයි.

ප්‍රතිකාර ලබාදීමට ප්‍රථම රෝගියා ඉතා හොඳින් පරීක්ෂා කරනු ලැබේ. ඒ මොහොතේ ඔහු විසින් ගනු ලබන වෙනත් ප්‍රතිකාර පිළිබඳව ද සොයා බලනු ඇත. අසාත්මිකතාවන් පිළිබඳව ද විශේෂයෙන් අධීක්ෂණය කළ යුතු වේ. රුධිර, මුත්‍රා, වකුගඩු ක්‍රියාකාරිත්වය ආදිය පරීක්ෂා කොට ඊසීජී සටහනක් ද ලබා ගනු ඇත.

මින් පසු පළපුරුදු වෛද්‍යවරයකුගේ අධීක්ෂණය යටතේ අන්තශ් ශෛරීකව එම තරල සිරුරට ප්‍රවේශ කරනු ලැබේ. රෝගියාට කිසිදු අපහසුතාවක් නොදැනේ. දැනුනත් ඉතා සුළුවෙති. කියවීම, නිදගැනීම, රූපවාහිනිය නැරඹීම, කතාබහ කිරීම, මැසීම වැනි ඕනෑම කටයුත්තක නිරත විය හැකිය. ප්‍රවේශන කටු වෙනස් නොවන ලෙස ප්‍රවේශම් වන්නේ නම් ඔබ මොබ ඇවිදීමට ද පිළිවන. සාමාන්‍යයෙන් ප්‍රවේශන 20 ත් 30 ත් අතර ප්‍රමාණයක් දිය යුතු වේ. පුද්ගලයාගේ සෞඛ්‍ය තත්ත්වය අනුව ඇතැම් රෝගීන්ට වසර කිහිපයක් ඇතුළත එවැනි ප්‍රවේශන සියයකට වැඩි ප්‍රමාණයක් දීමට සිදු විය හැකි ය.

මෙම ප්‍රතිකාර ක්‍රමය නිසා අතුරු ආබාධ කිසිවක් ඇති වන බවක් නොපෙනේ. රෝගියාට තම මෝටර් රථය පදවාගෙන හෝ වෙනත් ප්‍රවාහන ක්‍රමයකින් නිවෙස බලා ගිය හැකි ය. මෙය බයිපාස් සැත්කමට වඩා සිය ගුණයෙකින් ආරක්ෂා සහිත ය. ඇතැම් රෝගීනට කලාතුරකින් ඔක්කාරය, කැරකිල්ල හෝ හිසරුදව ක්ෂණික ආකූලත්වයන් වශයෙන් ඇතිවිය හැකි ය. මෙම ප්‍රතිකාරය නිසා වකුගඩු ක්‍රියාකාරිත්වය වර්ධනය කරනමුත් අසාමාන්‍ය වකුගඩු ක්‍රියාකාරිත්වයක් ඇති අයට තරල ප්‍රවේශනය හෙමින් සිදු කළ යුතු වේ.

ශ්‍රී ලංකාවේ මෙම ප්‍රතිකාරය සඳහා කොපමණ මුදලක් වැයවේදැයි නොදන්නාමුත් බයිපාස් සැත්කමකට හෝ රුධිර නාළ සැත්කමකට වඩා වියදම බෙහෙවින් අඩු බව නම් නිසැකව කිව හැකිය. අමෙරිකාවේ ප්‍රතිකාර වාර 30 ක් සඳහා ඩොලර් 4000 ක් වැය කළ යුතු වේ. බයිපාස් සැත්කමක් සඳහා සාමාන්‍යයෙන් ඩොලර් 40,000 ක් වැය කිරීමට සිදු වේ. වරකට ඩොලර් 115 ක් ගෙවා (වකුගඩු පරීක්ෂාව ද සහිතව) මෙම ප්‍රතිකාරය ලබා ගත හැකි ය. වරක් ප්‍රතිකාරය ලබා දීමට පැය 3 ටත් 4 ටත් අතර කාලයක් ගත වේ.

ඉහත සඳහන් රෝගාබාධවලට අමතරව මෙම ප්‍රතිකාර ක්‍රමය උපයෝගී කොට ගෙන වාතාබාධ, පාකින්සන් රෝගය, සොරයිසිස්, අධික රුධිරපීඩනය, චර්මාබාධ, ඇස් පෙනීමේ දුබලතා, පරිවෘත්තීය පිළිබඳ සංජානීය ආබාධ විකිරණය නිසා අතිවන රෝගී තත්ත්වයන් ආදිය ද සුවපත් කොට තිබේ. ප්‍රතිකාරයෙන් පසු රෝගියා නිරිහත් කරනු ලබන අතර උද්යෝගීමත් බවක් ද ඔහු තුළ පෙන්නුම් කරයි. සූරිච් විශ්වවිද්‍යාලය මගින් මෑතකදී කරන ලද පරීක්ෂණයකදී ප්‍රතිකාරය ලබා ගත් අය අතර පිළිකා රෝගය නිසා මියයන්නවුන්ගේ සංඛ්‍යාව සියයට 90 කින් අඩු වූ බව පෙන්වා දී තිබේ. එහෙත් අසාධ්‍ය රෝගීන් සුව ලැබූ බවක් නම් නොපෙනේ. පිළිකා වර්ධනය වීමේදී මුක්ත බණ්ඩ සැළකිය යුතු ලෙස බලපාන බව පරීක්ෂණවලදී හෙළිදරව් වී ඇත. මෙම ප්‍රතිකාරය මගින් මුක්ත බණ්ඩ Free radicals අවහිර කරනු ලබයි. මෙවැනි යහපත් ප්‍රතිඵල නිසාම කීලේසන ප්‍රතිකාර ක්‍රමය ලොව පුරා පැතිරෙමින් පවතී. ❑

**පරිවර්තනය :**
**කේ.ඩබ්ලිව්.ඒ. ජයවර්ධන**